## 375 සුර ලොව්නේ

සුර ලොව්නේ බැස මේදිනේ මවුකුසිනේ බිහිවඩ්නේ
එරි දෙතනේ කිරි බොම්නේ මිහි ලෙසිනේ වැඩුනු තැනේ

අයි අයියෝ අප උදෙසා ආ
දේව පුත්‍රයා විඳි දුක්සා

දිලෙන රතේ රුව ලෙසිනේ මල් උයනේ සිටිය දිනේ
මෙම මරණේ ඔබට වුනේ කිමෙක අනේ දෙව් රජුනේ

රන් කෙඳිසේ වරල දිසේ රන් කුසයේ ගහන රුසේ
නිල් මිණිසේ සොබන ඇසේ සවන දිසේ විදුලිය සේ

රන් රුවසේ ගත වෙනසේ රුසිරු මෙසේ අසන ලෙසේ
මෙපණලසේ ගිය විගසේ සැම දවසේ වාම් කෙසේ

නිති සොබනා රුසිරු මෙනා මෙඔබ විනා කවුද වෙනා
දිවිද ලිනා ඔප වඩනා දිලෙන රනා රුව ලෙසිනා

සියලු දනා සතුටු වෙනා මිවුරුවනා රස බසිනා
සුර වරනා දිව් රුගෙනා පවු බිඳිනා ගියෙ මේදිනා

සොබන විලේ මල් උපුලේ කමළුපුලේ දෙනෙත දිලේ
සිත ඇතුලේ ලොබ නොකළේ මෙ ඔබ ලොලේ විය අවුලේ

මෙසක්වලේ තෙදත බලේ පෑ පු පලේ පෙර එකලේ
දැන් මෙකලේ මෙපණනලේ නැත අසලේ කිත්ද කලේ